ගිකෝර

අර්මේනියානු ලේඛක
හොවානෙස් තුමාන්‍යාන්

පරිවර්තනය
මුතුමුදලිගේ
නිශ්ශංක

ගිණුකාර්

හයවන මුද්‍රණය : ජනවාරී 2025

ISBN 978-624-5552-22-1

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත

කොළඹ 10

කෝදුපත් පරීක්ෂාව

අශෝක කුලතුංග

කවර නිර්මාණය

ප්‍රදීප් ප්‍රේමලාල්

පරිඝනක පිටු සැකසුම

කාවින්ද්‍යා රත්නායක

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

ප්‍රකාශනය : පොත්මී ප්‍රකාශන

I will dedicate this amazing book to
My professors of Yerevan State University,
With love and respect
To

Simon Petrosyan

Marina BabakAnyan

Nune Aviazyan

Narine Torosyan

Gayane Balyan

1

මේ දේ කරනවට කවුරුවත් ම කැමති වුණේ නැහැ, ඒත් ගෙදර ගෘහ මූලිකයා වුණු හම්බෝ ඒ දේ කරන්න ම හිතා ගත්තා. එයාගේ අදහස වෙනස් කරන්න කාටවත් ම පුළුවන් වුණේ නැහැ.

හම්බෝ තීරණය කළා එයාගේ අවුරුදු දොළහක පුංචි පුතා

"ගිකෝර්"ව නගරයට අරගෙන ගිහින් රස්සාවකට දාන්න.

"මේකා එතකොට ලෝකය ගැන දැන ගනීවි" ඔහු කිවුවා.

එහෙත් ඔහුගේ බිරිඳ නම් ඒ තීරණය ගැන ගොඩක් දුක් වුණා.

"මගේ අහිංසක දරුවව කිසිම අනුකම්පාවක් නැති මේ ලෝකයට යවන්න එපා" ඇය ඇඬුවා, වැලපුණා, ඒත් හම්බෝ ඇයව සතේකටවත් ගණන් ගත්තේ නැහැ.

එක්තරා සාමකාමී, එහෙත් ගොඩක් දුක්බර උදෑසනක පුංචි ගිකෝර්ට එයා ජීවත් වුණු ගමෙන් සමුගන්නට සිද්ද වුණා.

ගිකෝර්ගේ පවුලේ අය, අසල්වැසියන් එක්ක ගමේ මායිමට වෙනකන් ම ගිකෝර්ගේ පස්සෙන් ආවා.

ගමේ මායිමේ දී ඔවුන් ගිකෝර්ව වැලඳ ගත්තා; ඔහුට හාදු දුන්නා. ගිකෝර් තාත්තත් එක්ක එයා ඈතට යන හැටි බලාගෙන හිටියා. ගිකෝර්ගේ නංගී "ෂැනී" හොඳට ම ඇඬුවා. ගිකෝර්ගේ මල්ලි පුංචි "ගැලෝ" ගිකෝර් ඈත් වෙලා යන දිහා බලාගෙන කෑ ගැහැවුවා.

"ගිකෝ... ගිකෝ.. කොහේද ඔයා යන්නේ ගිකෝ?"

ටික දුරක් ගිහින් ගිකෝර් ආයෙමත් පිටුපස හැරිලා බැලුවා. එයා දැක්කා ගමේ හැමෝම තවමත් ගම් මායිමේ හිටගෙන ඉන්නවා. එයාගේ අම්මා ලේන්සුවකින් ඇස් දෙකෙන් වැටෙන කඳුළු පිහදනවා. ගිකෝර්ට හිතුණා තාත්තගේ අත අත්හැරලා අම්මා ළඟට දුවගෙන යන්න. ඒත් තාත්තා ගොඩක් තදින් ගිකෝර්ගේ

අත අල්ලගෙන හිටපු නිසා එයාට එහෙම කරන්න පුළුවන් කමක් තිබුණේ නැහැ.

***

ටික දුරක් ගියා ම තාත්තා එයාගේ අත බුරුල් කළා. ගිකෝර් පිටිපස්ස හැරිලා බැලුවා. එහෙත් ඒ වෙනකොටත් ගම්මානය කන්දට වැහිලා ගිහින්. එයාට කාවවත් පෙනුණේ නැහැ. එයා තාත්තගේ අනිත් පැත්තටත් මාරු වෙලා බැලුවා. ඒත් කිසිම දෙයක් පෙනුණේ නැහැ.

ගිකෝර් සැරින් සැරේ පිටිපස්ස හැරි හැරි යනවා දැකපු එයාගේ තාත්තා හම්බෝ කෑ ගැහැවුවා.

"අඩිය ඉක්මන් කරලා වරෙන් ගිකෝර්... අපි දැන් නගරයට ළඟ යි"

නගරයට යන්න තිබුණු පාර තිබුණේ කඳු පන්තියක් හරහා. ගිකෝර් තාත්තත් එක්ක කඳු එකින් එක නගින්න පටන් ගත්තා.

ටික වෙලාවකින් ඔවුන් කඳු මුදුනකට ආවා.

එතකොට ගිකෝර් දැක්කා කන්ද පහතින් ගොඩක් පුංචියට එයාගේ ගම පේනවා. ගිකෝර්ට ගොඩක් සතුටු හිතුණා. එයා සතුටින් කෑගහන්න පටන් ගත්තා.

"තාත්තේ මට අපේ ගේ පේනවා.. මට අපේ ගේ පේනවා"

ගිකෝර් ඇතින් යාන්තමට පේන ගම්මානය දිහාවට ඇඟිල්ල දික් කරගෙන තාත්තට කිවුවා.

හම්බෝත් ඒ පැත්ත හැරිලා බැලුවා. ඈතින් ගම්මානයත් පෙනුණේ යාන්තමට නිසා ගෙයක් නම් කොහෙත් ම පෙනුණේ නැහැ. හම්බෝ මුකුත් ම නොකියා අහක බලා ගත්තා.

"අඩිය ඉක්මන් කරලා වරෙන් ගිකෝර්... අපි දැන් නගරයට ළඟ යි"

2

ගමෙන් පිටවෙලා ආපු මුල් ම රාත්‍රිය හම්බෝ ගත කළේ එයාගේ පරණ යහළුවෙක්ගේ නිවසක.

ඒ යහළුවත් බොහෝ ම සාදරයෙන් හම්බොව පිළිගත්තා.

ටික වෙලාවකින් ගෙදර හිටපු පුංචි ගැහැනු ළමයෙක් අමුත්තන්ට තේ හදන්න පටන් ගත්තා.

ඇය තේ හදද්දී වීදුරු එකිනෙකට ගැටීමෙන් ආපු "සිලින්... සිලින්" සද්දේ ගේ පුරා ම පැතිරිලා ගියා. ගිකෝර් ඇය දිහා බැලුවා. ඒ පුංචි ගැහැනු ළමයා ඇඳගෙන හිටියේ ලස්සන රතු පාට ගවුමක්.

'මේ ගවුම නම් ෂැනීටත් ගොඩක් ලස්සනට තියෙයි' ගිකෝර් හිතුවා.

එදා ගිකෝර් ස්ථිරව ම එක දෙයක් අධිෂ්ඨාන කරගත්තා. ඒ තමයි කවදා හරි නගරයේ රස්සාවෙන් මුදල් හම්බ කළා ම එයාගේ නංගි ෂැනීටත් මේ වගේ ලස්සන රතු ගවුමක් අරන් දෙන්න.

රාත්‍රී ආහාරයෙන් පස්සේ හම්බෝ එයාගේ යහළුවත් එක්ක ගොඩක් වෙලා කතා කළා. ගිකෝර්ව නගරයට අරගෙන යන එක ගැන ඔහුගේ යහළුවත් බොහෝ ම සතුටු වුණා. ඒ ගැන ඔහු හම්බෝට ප්‍රශංසා කළා.

"පොඩි එකා මේ ලෝකය ගැන දැනගන්න ඕනේ" ඔහු කිවුවා.

ඒ කතාවෙන් පස්සේ ඒ දෙන්නා යුද්ධය ගැන කතා කරන්න පටන් ගත්තා. ඊට පස්සේ කාලා, බීලා ඉන්න බැරි වෙන තරමට ම කෑම බීමවල මිල වැඩි වුණ හැටි කතා කළා. ඊටත් පස්සේ තවත් ගොඩක් දේවල් ගැන කතා කළා. ඒත් ගොඩක් දුර ඇවිදපු මහන්සිය නිසා ම ගිකෝර්ට ඒ වෙනකොටත් හොඳට ම නින්ද ගිහින් තිබුණා.

ඊට පහුවෙනිදා ඔවුන් නගරයට ළඟා වුණා. නගරයේ ගත කරපු මුල් ම දවසේ ඔවුන් ගත කළේ අශ්වයන් බලා ගන්නකුගේ මඩුවක. එදා රාත්‍රිය මඩුවේ ගත කරපු හම්බෝ පහුවෙනිදා උදෙන් ම ගිකෝර්වත් අරගෙන නගරයේ වෙළඳපොළට ගියා.

"පොඩි එකා මේ ලෝකය ගැන දැනගන්න ඕනේ"

3

හම්බෝ ගිකෝර්ට රස්සාවක් හොයමින් වෙළඳපොළේ හැමතැන ම ඇවිද්දා. මෙහෙම ඇවිදගෙන යද්දි ඔහුට ඇහුණා කඩ සාප්පුවක් ඇතුළේ ඉඳන් කවුද කතා කරනවා.

"ඔබ මේ පොඩි එකාට රස්සාවක් ද හොයන්නේ?" හම්බෝ සාප්පුවට ඔළුව දාලා බැලුවා. ඒ තමයි සාප්පුවේ හිටපු වෙළෙන්දා.

"ඔව් මහත්මයා" හම්බෝ බොහෝ ම ගරුසරුව පිළිතුරු දුන්නා.

වෙළෙන්දා ගිකෝර් දිහා හොඳට බැලුවා. ඔළුවේ ඉඳන් කකුල් දෙකට වෙනකන් ම බැලුවා.

"එහෙනම් මේකව මට දීපන්" ගිකෝර් දිහා බලාගෙන ම වෙළෙන්දා කිවුවා.

වෙළඳාම ඉක්මනට ම වෙච්ච එක ගැන හම්බෝටත් ගොඩක් සතුටු හිතුණා.

ඉතින් හම්බොත් ගිකෝර්ව "බෂාස් අර්තෙම්" කියන මේ වෙළෙන්දගේ ගෙදර වැඩකාර කමට දෙන්න එකඟ වුණා. හැබැයි අර්තෙම් ගිකෝර්ව රස්සාවට ගත්තේ කොන්දේසි කිහිපයක් මත.

ගිකෝර් අර්තෙම්ගේ නිවස පිරිසිදුව තියාගන්න ඕනේ, වළං පිඟන් හෝදන්න ඕනේ, සපත්තු ඔප දාන්න ඕනේ, අර්තෙම්ගේ දවල් කෑම එක එයාගේ කඩේට ම ගෙනත් දෙන්න ඕනේ. ඒ වගේ ම ගෙදර තියෙන අනිත් පොඩි පොඩි වැඩ සේරමත් කරන්න ඕනේ.

ගිකෝර්ට අර්තෙම් කියපු ඒ දේවල් ගැන ඒ තරම් වැටහීමක් තිබුණෙ නැති නිසා එයා මුකුත් ම කිවුවේ නැහැ. එහෙත් එයාගේ තාත්තා හම්බෝ නම් ගිකෝර්ගේ ඔළුව අතගාලා කිවුවා,

"මගේ පුතා ඒ හැම දේම හොඳට ම කරයි" කියලා.

ඒ වගේ ම අර්තෙම් පොරොන්දු වුණා අවුරුද්දක් ගෙදර වැඩකාරයෙක් විදියට වැඩකළාට පස්සේ, ගිකෝර්ට කඩේ වෙළඳාම ගැන උගන්නන්න.

"කඩේ වැඩ ඉගෙන ගත්තට පස්සේ කොල්ලට කඩේ රස්සාව කරගෙන ඉන්න පුළුවන්" බෂාස් අර්තෙම් කිවුවා.

"ඒත් අවුරුදු පහක් යනකන් මම මේ පොඩි එකාට සතයක්වත් ගෙවන්නේ නැහැ. ඇත්තම කිවුවොත් මේකව නගරයේ තියාගෙන වෙළඳාම උගන්නනවට හරි නම් මටයි මුදල් ගෙවන්න ඕනේ, මොකද මේකා කිසිම දෙයක් දන්න එකෙක් නෙමෙයිනේ"

හම්බෝත් ඒ අදහස පිළිගත්තා.

"මොනවද කියන්නේ මහත්තයෝ, ඒකා කඩේ වැඩකරන හැටි දන්නව නම් මම ඒකව මේ නගරයට එක්ක එනවායැ, ඒක නොදන්න නිසා තමයි මම මෙහෙට එක්කන් ආවේ, පොඩි එකා මොනවා හරි ඉගෙන ගන්න ඕනේ නිසා"

"ඒකා ඉගෙන ගනියි, ඒකා හැම දේම ඉගෙන ගනියි, හොඳට ඉගෙන ගනියි. ඔහේ දන්නවත් ඇති ඔහේලගේ ගමෙන් ආපු නිකෝල් කියන හාදයාව. ඒ කොල්ලත් පොඩි කාලේ වැඩ ඉගෙන ගත්තේ මගෙන් තමයි. පස්සේ මගෙන් හැම දේම ඉගෙන ගෙන ගිහින් ඒකා ඒකගෙ ම කඩයක් ඇරියා මේ වෙළඳපොළේ ම, නිකන් නෙමේ මගේ කඩේ තියෙන ඒවත් හොරකන් කරගෙන ගිහින්"

බෂාස් අර්තෙම් බොහෝ ම කෝපයෙන් කිවුවා.

"මගේ පොඩි එකා නම් එහෙම අවලත්ත වැඩක් කරන්නේ නැහැ මහත්තයෝ. ඒකා එහෙම කළොත් මම මගේ මේ අත්දෙකෙන් ම ඒකව අරගෙන ගිහින් කුරා ගඟට විසිකරනවා.. අම්මපා" හම්බෝ පපුවට අත තියලා දිවුරන ගමන් අර්තෙම්ට කිවුවා.

"හරි කොල්ලා එහෙම අවංකව ම වැඩ කළොත් මම මූව අනිවාර්යෙන් ම ලොකු මිනිහෙක් කරනවා"

"අන්න ඒකයි මහත්තයෝ මටත් ඕනේ. මටත් ඕනේ මේකව කවදා හරි ලොකු මිනිහෙක් කරන්න. මේකා අකුරු සාස්තරය ඉගෙන ගන්න ඕනේ, කියවන්න ලියන්න දෙක ම හොඳට ඉගෙන ගන්න ඕනේ, මිනිස්සු එක්ක කතා කරන්න, මිනිස්සු කියන දේ තේරුම් ගන්න ඉගෙන ගන්න ඕනේ.

පොඩි වුණාට මේකා දස්සයා, ගමේ හිටියොත් මේකත් මන් වගේ ම නිකමෙක් වෙනවා. ඒකයි මම මේ පොඩි එකාව මේ

වයසෙ දි ම නගරෙට එක්කන් ආවේ.

මහත්තයට විතරයි පුළුවන් මගේ දරුවව ලොකු මිනිහෙක් කරන්න. මහත්තයට මම ඒකට ගොඩක් ස්තුතිවන්ත වෙනවා." හම්බෝ කිවුවා.

ඒ වෙලාවේ හම්බෝගේ ඇස් දෙකෙන් කඳුළුත් මතු වුණා. මොකද හැම තාත්තා කෙනෙක්ට ම වගේ හම්බෝටත් ඕනේ වුණේ තමන්ගේ පුතා හොඳට සල්ලි හම්බකරන මිනිහෙක් වෙනවා දකින්න.

"ඒත් මහත්තයෝ, මේකා තාම පොඩි එකා නිසා නගරය තාම හුරු නැහැ, මගේ කොල්ලව හොඳට බලා ගන්න, මට ඒ ඇති"

බෂාස් අර්තෙම් පොරොන්දු වුණා ගිකෝර්ව හොඳට බලාගන්න. ඒ වගේ ම කඩෙන් එළියට බැස්ස අර්තෙම් එළියේ තිබුණ සිල්ලර කඩේ දිහා බලලා කෑගහලා මෙහෙම කිවුවා.

"මගේ මේ අමුත්තන්ට බොන්න හොඳවයින් තේ දෙකකුයි, කෑමයි ගේනවා"

මේ සුළු සංග්‍රහයෙන් පස්සේ අර්තෙම් හම්බෝවයි, ගිකෝර්වයි එක්කගෙන එයාගේ ගෙදරට ගියා. ඒ දෙන්නට කුස්සියේ ඉන්න කියලා අර්තෙම් එයාගේ බිරිඳව මුණගැහෙන්න ගියා වැඩකාරකමට කොල්ලෙක් ගත්තා කියන පණිවිඩේ කියන්න.

"ඒත් අවුරුදු පහක් යනකන් මම මේ පොඩි එකාට සහයක්වත් ගෙවන්නේ නැහැ"

4

හම්බෝ එයාගේ අතේ තිබුණු දුම් පයිප්පය කටේ තියාගෙන ඒක උරන්න පටන් ගත්තා. ගිකෝර් තාත්තගේ උරහිසට ඔළුව තියාගෙන හිටියා.

"දැන් ඉතින් සේරම තියෙන්නේ උඹේ අතේ කොල්ලෝ, උඹ මට පෙන්නන්න ඕනේ උඹ ධෛර්යවන්ත එකෙක් විත්තිය. උඹ ඒකට මහන්සි වෙලා වැඩ කරන්න ඕනේ. හොඳට හැසිරෙන්න ඕනේ. ඒ වගේමයි උඹ නිකන් හරි මේ මිනිස්සුන්ට අවැඩක් කළොත් අන්න ඒ වෙලාවට මට යකා ඇවිස්සෙයි, උඹ අන්න ඒකත් දැනගන්න ඕනේ. උඹට තේරුණා ද ගිකෝර්?"

හම්බෝ ගිකෝර්ගෙන් ඇහැවුවා.

"ඔව්" ගිකෝර් ඔළුව වැනුවා.

ගිකෝර් එයා ඉඳගෙන හිටිය කුස්සිය දිහා හොඳට බැලුවා. ගමේ ගෙදර කුස්සියට වඩා ඒ කුස්සිය ගොඩක් වෙනස්.

"තාත්තේ ඒගොල්ලන්ට ගේ ඇතුළේ ගිනි ගොඩ ගහන තැනක් නැද්ද?" පුංචි ගිකෝර් කුස්සිය පුරා බලමින් කිවුවා. හම්බෝ ඒකට හිනා වුණා.

"ඕ, ගිකෝර් මේක නගරය කොල්ලෝ, මේ මිනිස්සු ගමේ අපි වගේ ගිනි ගොඩවල් ගහන්නේ නැහැ, ඒගොලන්ට ගිනි උදුන් තියෙනවා"

"අඩු ම තරමින් ඒගොල්ලන්ට ගොයම් තලන තැනක්වත් නැහැ" ගිකෝර් ආයෙමත් කිවුවා.

"නගරයේ මිනිස්සු ගොයම් තලන්නේ නැහැ ගිකෝර්, ඒවා සිද්ද වෙන්නේ ගමේ"

"කොහොමද තාත්තේ ඒගොල්ලෝ කන්න පාන් හදන්නේ"

"නගරයේ මිනිස්සු පාන් ගන්නේ සල්ලිවලට, දර ගන්නේ සල්ලිවලට, බටර්, චීස්, අඩු ම තරමින් වතුරත් ගන්නේ සල්ලිවලට... උඹ මේ ඉන්නකොට ඔයිට වැඩිය දේවල් දැනගනීවි"

"ඕ.."

ගිකෝර්ට ඒ කතාවට නම් පුදුමත් හිතුණා. ගමේ ගෙවල්වල වගේ කුස්සිය ඇතුළේ පාන් පෝරනුවක් නැති එක නම් එයාට ඇත්තටම පුදුම වෙන්න කරුණක්. ඒ හැම දේම සල්ලිවලට ගන්න එක ඊටත් වඩා පුදුමයක්.

ගිකෝර්ගේ මුහුණ දිහා බලලා හිනා වුණු හම්බෝ ආයෙමත් මෙහෙම කිවුවා.

"මේක තිබිලීසී කොල්ලෝ, උඹ හොඳට හිටියොත් උඹ ගොඩක් ලොකු සල්ලිකාරයෙක් වෙයි"

"එතකොට තාත්තේ ඒගොල්ලන්ට මේ නගරේ පල්ලියක් තියෙනව ද?"

"ඔව්, ඔව් ගිකෝර්, ඒ මිනිස්සුත් අපි වගේ ම ක්‍රිස්තියානි අය. උඹ දැන් ඒවා මේවා කතා නොකර මම කියන දේ හොඳට අහගනින්...

උඹ මේ මිනිස්සුන්ට බොහෝ ම කීකරුව සලකන්න ඕනේ... කිසිම දෙයක් හොරකන් කරන්න එහෙම එපා. ගෙදර අය සමහර විට උඹව පරීක්ෂා කරන්න සල්ලි එහෙම උඹට පේන තැනකට තියයි, උඹ ඒවා අල්ලන්නවත් යන්න එපා තේරුණා ද?"

ගිකෝර් ඔළුව වැනුවා.

"උඹ නිකන් හරි ඒ සල්ලි අතට ගත්තොත් ඒ වෙලාවෙ ම නෝනා හරි, මහත්තයා ළඟට හරි ගිහින් අහන්න ඕනේ,"

"කාගේ ද මේ සල්ලි, මම හිතන්නේ කාට හරි අමතක වෙලා තියලා ගිහින් කියලා" අන්න එහෙම, උඹට තේරුණා ද, එහෙම නැති වුණොත් උඹට ලොකු දඬුවමක් ලැබෙයි"

"එතකොට මේ පොලිසියේ අයත් ඉන්නව ද?" ගිකෝර් ආයෙමත් ඇහැවුවා.

"ඔව් මේ ඉන්නවා. උඹ ඒවා ගැන වද වෙන්න ඕනේ නැහැ, උඹට කරන්න තියෙන්නේ මේ මිනිස්සු සන්තෝෂෙන් කීයක් හරි දුන්නොත් ඒක ගමෙන් එන කාගේ හරි අතේ ගෙදරට එවන්න. මොකද ගෙදර කරන්න දේවල් දාහකටත් වැඩිය තියෙනවා. උඹ ඒක දන්නවනේ ගිකෝර්"

හම්බෝ බොහෝ ම බැරෑරුම් මුහුණක් මවාගෙන කිවුවා.

ඒ වගේ ම උඹත් පරිස්සමෙන් ඉඳපන් මගේ කොල්ලෝ, රෑට හොඳට පොරවගෙන නිදා ගනින්, නැත්නම් සීතලට උඹව ලෙඩ වෙයි, මේ සීතල හරි ම නරක සීතලක්."

හම්බෝ ගිකෝර්ට උපදෙස් දෙද්දී ඔහු උරපු දුම් කෝවෙන් පිටවුණු දුමින් ඔහුගේ මුහුණ වැහිලා ගියා.

"උඹ තවත් දෙයක් තේරුම් ගන්න ඕනේ මගේ කොලුවෝ, මේ මිනිස්සු උඹට පොඩි පාන්පෙත්තකුයි, ඉතිරි වුණ කෑමවලින් ටිකකුයි කන්න දෙයි. සමහර දවස්වලට මුකුත් ම කන්න නොදෙන්නත් පුළුවන්. ඒත් උඹ ඒවා ගැන වැඩිය හිතන්න ඕනේ නැහැ. ගොඩක් වැඩකාරයන්ට ඒ දේ වෙනවා.

උඹවත් දන්නේ නැතිව ම දවස් ඉක්මනට ගෙවිලා යයි, ඒ නිසා ඉවසගෙන ඉඳපන්, තේරුණා ද ?"

හම්බෝ ඔහුගේ අවවාද දිගට ම දෙද්දි, ඔළුව තාත්තගේ උරහිසට තියාගෙන හිටපු ගිකෝර්ට නින්ද ගිහින් තිබුණා. ගමේ ඉඳන් නගරයට ආපු දවස් දෙකට ගොඩක් දේවල් දැකපු නිසා ගිකෝර්ට හොඳට ම මහන්සියි.

ගිකෝර් ආයෙත් අවදිවෙද්දි තාත්තා ළඟ හිටියේ නැහැ. තාත්තා ආයෙමත් ගමට යන්න ගිහින්.

"උඹවත් දන්නේ නැතිව ම දවස් ඉක්මනට ගෙවිලා යයි, ඒ නිසා ඉවසගෙන ඉඳපන්, තේරුණා ද ?"

5

ගිකෝර්ව දැකපු මුල් ම මොහොතේ ඉඳන් බෂාස් අර්තෙම්ගේ බිරිඳ "නැත්තෝ නෝනා" ග්‍රිකෝර්ට වෛර කළා. ඇය අර්තෙම්ට බැන වැදුණා වැඩකාරමකට අරන් ආපු කොලුවා මෝඩ, මුරණ්ඩු කොල්ලෙක් කියලා. එහෙත් බෂාස් අර්තෙම් නම් සතයක්වත් වියදම් නොකර වැඩකාරකමට කොලුවෙක් හොයා ගන්න ලැබීම ගැන බොහෝ ම ආඩම්බරෙන් කතා කළා.

"හැමදාමත් ඕකා ඔය විදියට ඉන්නේ නැහැ. හැම දේම ඉගෙන ගනියි" අර්තෙම් එයාගේ බිරිඳට කිවුවා.

"ඒකනේ, ඒ කොල්ලා ඔය මෝඩ කමට හිටියට හැම දේම ඉගෙන ගනියි, ඔයා ඒ ගැන හිතන්න එපා"

අර්තෙම්ගේ වයසක අම්මත් ඇයගේ ලේලියට කිවුවා.

එහෙත් නැත්තෝ නෝනා නම් ඒ කිසිම දෙයක් කනකට ගත්තේ නැහැ. ඒ නිසා ඇය නිතර නිතර ම අර්තෙම් එක්ක වාද කළා. මේ වගේ ගමේ කොල්ලෙක් ගෙදරට වද්ද ගැනීමට සිද්දවීම ගැන ඇය ඇයගෙ ම දෛවයට ශාප කළා.

ගිකෝර්, අර්තෙම්ගේ කුස්සියේ ඉඳගෙන හිටියා. ඔහු මෙහෙකාර සේවයට ලෑස්ති වෙලයි හිටියේ.

වැඩකාරයෝ අඳින්න ඕනේ පරණ ඇඳුම් නිසා අර්තෙම් එයාගේ පරණ ඇඳුම් කිහිපයක් ගිකෝර්ට දුන්නා.

ඔහු අර්තෙම්ගේ පරණ තොප්පියක් පැලඳගෙන හිටියා. ඒ තොප්පිය ගිකෝර්ගේ ඔළුවට ලොකු නිසා ම ඒක කන් දෙක ළඟට ම පහත් වෙලා තිබුණා. ඔහු අර්තෙම්ගේ පරණ හම් සපත්තු දෙකක් පැලඳ ගෙන හිටියා. නිල් පාට ලොකු කමිසයක් ඇඳගෙන හිටියා. මේ හැම දේම ගිකෝර්ගේ ඇඟටත් වඩා දෙගුණයක් විතර ලොකු වුණ නිසා ඇඟෙන් පහතට වැක්කෙරුණා. ඔහු කුස්සියේ තිබුණු පුටුවක් උඩ ඉඳගෙන කල්පනා කළා.

මොනවා කරන්න ද, වැඩකාරකම කොතනින් පටන් ගන්න ද කියලා ගිකෝර්ට හිතාගන්නවත් බැහැ. ගමෙන් නගරයට ආපු එක ගැනත් ගිකෝර්ට ගොඩක් දුක හිතුණා.

මේ වෙලාවේ නැත්තෝ නෝනා කුස්සියට ආවා. ගිකෝර් කුස්සියට වෙලා මුකුත් ම නොකර ඉඳගෙන ඉන්නවා දැකපු නැත්තෝ නෝනට හොඳට ම තරහා ගියා. ඇය ගිකෝර්ට මොකක්ද කිවුවා. එහෙත් ගිකෝර්ට ඇය කිවුවේ මොකක්ද කියලා හරියට තේරුණේ නැහැ.

"ඒයි මම කතා කරන්නේ උඹටයි.. කැලෑ සතා"

ඇයගේ කටහඬේ දරුණු කම නිසා ම ගිකෝර්ව ගැස්සුණා. නැත්තෝ මහත්මියට කොහොම පිළිතුරු දෙන්න ද කියලා එයාට හිතාගන්න බැරි වුණා. ගිකෝර්ගේ මුළු ඇඟ ම සීතල වෙලා දහදියත් දැම්මා.

ගිකෝර් බය වෙලා වගේ බලාගෙන ඉන්නවා දැකපු නැත්තෝ නෝනා ගිකෝර්ට ශාප කළා.

"අපිව විනාශ කරන්න ආපු මේ යක්ෂ පැටියට මම කියන කිසිම දෙයක් හරියට තේරුම් ගන්න බැහැ. මගේ කරුමෙට අර මිනිහත් මේ කැලෑ සතාව මේ ගෙදරට ම ගෙනාවනේ"

කියපු නැත්තෝ නෝනා කුස්සියේ දොරත් වේගයෙන් වහලා දාලා එතනින් යන්නට ගියා. ගිකෝර් හොඳට ම බය වුණා.

"දැන් ඉතින් සේරම ඉවරයි" ගිකෝර් හිතුවා.

"මාව මෙහෙන් එලෙව්වොත් මම කොහොමද ආයේ ගමට යන්නේ? තාත්තත් ගියා" ගිකෝර් කල්පනා කළා.

හැම දේම ඉවර වුණා කියලා එයා හිතපු මේ වෙලාවේ බෂාස් අර්තෙම්ගේ වයසක අම්මා කුස්සට ආවා. කළු පාට දිගු ගවුමක් ඇඳ සිටි ඇය බොහෝ ම කරුණාවන්තව ගිකෝර්ට කතා කළා.

"ඇයි මගේ දරුවෝ නැත්තෝ මහත්මිය ආපු වෙලාවේ නැගිට්ටේ නැත්තේ, ඇයි එයා අහපු ප්‍රශ්නයට උත්තර දුන්නේ නැත්තේ" ඇය ගිකෝර්ගෙන් ඇහුවා.

"මීට පස්සේ කවුරු හරි ඔයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා ම ඔයා උත්තර දෙන්න ඕනේ තේරුණා ද?"

ගිකෝර් ඔළුව වැනුවා.

ඇය ගිකෝර්ට අම්මා කෙනෙක් දරුවෙක්ට උගන්නනවා වගේ හැම දෙයක් ම කියලා දුන්නා. ගෙදර ලාම්පුව පත්තු කරන හැටි, සපත්තු සුද්ද කරන හැටි, වළං සෝදන හැටි, මේ හැම දෙයක් ම.

"ඒයි මම කතා කරන්නේ උඹටයි.. කැලෑ සතා"